# පැළෑණ සිරි වජිරඤාණ දහම් පාසල - වැලිගම
# Pelena Siri Vajirañāna Dhamma School - Weligama

## ශ්‍රී බු. ව. 2566 - මධ්‍යවාර පරීක්ෂණය - 2022 දෙසැම්බර්
## 2566 B.E. - Mid Term Test - 2022 December
## 08 ශ්‍රේණිය - Grade - 08

**විභාග අංකය:-** ………………………………………………… **කාලය : පැය 02 යි.**

**I කොටසේ ප්‍රශ්න සියල්ලටත් II හා III කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. පැවිද්දෙකු විසින් අත්හළ යුතු අන්ත දෙකත්, මධ්‍යම ප්‍රතිපදාව අගයත්, චතුරාර්ය සත්‍යත් ඇතුලත් දේශනාව කුමක්ද?

i. අනත්ත ලක්ඛණ සූත්‍රය යි. ii.ධම්මචක්කප්පවත්වන සූත්‍රය යි.

iii. චුල්ලහත්ථිපදෝපම සූත්‍රය යි. iv. මහා පරිනිබ්බාන සූත්‍රය යි.

02. බුදුරජාණන් වහන්සේ සිය පළමු වස් කාලය ගත කලේ කිනම් ස්ථානයේද?

i. සැවැත්නුවර ජේතවනාරාමයේ ය. ii. රජගහනුවර වේළුවනාරාමයේ ය.

iii. බරණැස ඉසිපතනාරාමයේ ය. iv. කිඹුල්වත් නුවර මාලිගාවේ ය.

03. බුද්ධත්වයෙන් මුල් විසිවස තුළ සිදු වූ වැදගත් සිදු වීමක් නොවන්නේ මින් කුමක්ද?

i. භික්ෂුණී ශාසනය ආරම්භ වීම. ii. විශාලා මහ මහනුවර තුන්බිය දුරුකිරීම.

iii. මාතෘ දිව්‍ය පුත්‍රයාට අභිධර්මය දෙසීම. iv. විනය නීති පැනවීම.

04. සියලු ධර්මයන් කොටස් වශයෙන් බෙදා දැක්වූ නිසා බුදුරජාණන් වහන්සේ,

i. සත්ථා නම් වන සේක ii. භගවා නම් වන සේක

iii. බුද්ධ නම් වන සේක iv. අරහං නම් වන සේක

05. අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ස්වභාවත්වය හැඳින්වීම් පිණිස යොදා ගැනෙන වචනය මින් කුමක්ද?

i.ත්‍රිශික්ෂාව ii.ත්‍රිභවය

iii.ත්‍රිලක්ෂණය iv.ත්‍රිවිද්‍යාව

06. අවබෝධයෙන් යුතුව ඉන්ද්‍රිය පාලනය කර ගැනීම යන අදහස ඇති පදය මින් කුමක්ද?

i. නිපකෝ ii. අප්පකිච්චො iii. සල්ලහුකවුත්ති iv. සන්තින්ද්‍රිය

07. බුදුරජුන් ජීවමාන සමයෙහි මගධාධිපති, සෙනිය, ධම්මික යන ගෞරව නාමවලින් හැඳින්වූ රජතුමා කවුද?

i. අජාසත්ත රජතුමා ය.
ii. පසේනදී කොසොල් රජතුමා ය.
iii. බිම්බිසාර රජතුමා ය.
iv. බුද්ධදාස රජතුමා ය.

08. නුවණැති භික්ෂුණීන් වහන්සේලා අතර අග තනතුර ට පත්වූ තෙරණිය කවුරුද ?

i. ඛේමා තෙරණිය
ii. උප්පලවන්නා තෙරණිය
iii. යශෝධරා තෙරණිය
iv. පටාචාරා තෙරණිය

09. බුදු සිරිපා සටහන පිහිටා ඇතැයි විශ්වාස කෙරෙන ස්ථාන ගණන කීයද?

i. 02කි
ii. 16කි
iii. 01කි
iv. 04කි

10. බිම්බා දේවිය යන අපර නාමයෙන් ප්‍රසිද්ධ වූයේ,

i. මහාමායා දේවිය යි.
ii. මහාප්‍රජාපතී ගෝතමී දේවිය යි.
iii. පත්තිනි දේවිය යි.
iv. යසෝදරා දේවිය යි.

**(ලකුණු 20)**

## 11 සිට 20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිරිත් පිළිතුරු සපයන්න.

11. ඉන්ද්‍රිය සංවරය යනු කුමක්ද?
12. සබ්බේ සංඛාරා යනුවෙන් හඳුන්වා ඇත්තේ මොනවාද?
13. උපාසක චණ්ඩාල ලක්ෂණ මොනවාද?
14. යසෝදරා තෙරණියගේ චරිතයෙන් මතුකර ගත හැකි උතුම් ගුණාංග 04ක් ලියන්න.
15. මෙත්ත සූත්‍රයේ සඳහන් වන නිපකෝ ගුණය හඳුන්වා දෙන්න.
16. බුදුන් වහන්සේගේ බුද්ධ නම් බුදු ගුණය හඳුන්වන්න.
17. කර්මය කුසල හා අකුසල වෙන්කර හඳුනාගන්නේ කෙසේ ද?
18. චෛතසිකයන්හි ලක්ෂණ කවරේ ද?
19. ලංකාවේ භික්ෂුණී සාසනය ආරම්භ වූයේ කෙසේ ද?
20. බිම්බිසාර රජුගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ කවරේද?

**(ලකුණු 20)**

## II කොටස

01.

i. දුකට හේතුවන තෘෂ්ණාවේ තෙවැදෑරුම් ප්‍රභේද නම් කරන්න.

ii. ඉන්ද්‍රිය පහ සහ එයට ගොදුරුවන අරමුණු පහ නම් කරන්න.

iii. පෝනෝභවිකා, නන්දිරාග සහගතා, තත්‍රතත්‍රාභිනන්දිනී යන ලක්ෂණ තුන හඳුන්වා දෙන්න.

**(ලකුණු 15)**

02.

i. මුසාවාදය හා සම්බන්ධ අත්තූපනයික ධර්ම ක්‍රමය කුමක්දැයි හඳුන්වා දෙන්න.

ii. සිව්වන ශික්ෂා පදය ලියා විරමනය හා සමාදානය සිදුවන ආකාරය පෙන්වා දෙන්න.

iii. මුසාවාදය හෙවත් අනුන් රැවටීම අංග හතරකින් සම්පූර්ණවන බව බුදු දහමේ හැඳින්වේ එය නම් කරන්න.

**(ලකුණු 15)**

03.

i. දෙමාපියන් බ්‍රහ්ම යන නමින් හැඳින්වීමට හේතු කවරේදැයි පැහැදිලි කරන්න.

ii. සිඟාලෝවාද සූත්‍රයේ දෙමාපියන් පෙරදිග ලෙස හඳුන්වා ඇත්තේ ඇයි?

iii. දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටු කළ හැකි යුතුකම් මොනවාද?

**(ලකුණු 15)**

# III කොටස

04.

i. චෛතසික 52 ඒවායේ ස්වභාවය අනුව කොටස් පහකට බෙදේ. එය නම් කරන්න.

ii. යහපත් හා අයහපත් චෛතසික හඳුන්වන්නේ කවර නමකින් ද?

iii. සබ්බචිත්ත සාධාරණ චෛතසික 07 නම් කරන්න.

**(ලකුණු 15)**

05.

i. නමස්කාර පාඨය නිවැරදිව ලියා එහි අර්ථය ලියන්න

ii. පාලියට නගන්න

- මම පන්සිල් සමාදන් වෙමි.
- ශිෂ්‍යයා මල් පූජා කරයි.
- ගුරුවරු පහන් දල්වති.
- ඔබ පන්සල් යහි.
- අපි ගාථා සජ්ජායනා කරමු.

iii. මෙම ගාථාවෙහි පද පිළිවෙල නිවැරැදිව ලියා දක්වන්න

නාගවල්ලි දලූ පේතං - චුණ්ණපූග සමායුතං

තාම්බූලං පතිගණ්හාතු - සතං පූජේමිදං ජිනෝ

**(ලකුණු 15)**